මූලික පිරිවෙන් අවසාන විභාගය

චිරන්තන ගද්‍ය සංග්‍රහය

සද්ධර්ම රත්නාවලිය



තවද නිෂ්ප්‍රයෝජන කථාවෙන් ප්‍රයෝජන ලවයකුදු නැති නියාව භාගවතුන්ට කුණ්ඩලකේසී ගේ වස්තුව දක්වමු

කුණ්ඩලකේසීගේ වස්තුව

සිංහල සාහිත්‍යය

පූජ්‍ය. හල්ගම්පිටියේ සුමනකිත්ති හිමි

තවද නිෂ්ප්‍රයෝජන (ඵල රහිත/නිරර්ථක) කථාවෙන් ප්‍රයෝජන ලවයකුත් (ස්වල්ප වූ ප්‍රයෝජනයක් ද) නැති නියාව හඟවන්නට කුණ්ඩලකේසී ගේ වස්තුව දක්වමු.

කෙසේ ද යත් :-

රජගහ නුවර එක් සොළොස් හැවිරිදි (දහසය හැවිරිදි) විතර වූ (පමණ වූ) සිටු දුවණි කෙනෙක් විශිෂ්ට වූ රූප ශොභාවක් ඇත්තාහ. ඉතා ප්‍රසාදාවහයෝ ය. ඒ වයස පිරී සිටි ස්ත්‍රීහු ද යෞවන මදයෙන් මත් හෙයින් පුරුෂයන් කෙරෙහි ලොල් කම් ඇත්තෝ ය. උන්ගේ දෙමව්පියෝ ද උන් මිථ්‍යාචාරයෙන් (වැරදි හැසිරීමෙන්) නවතනු නිසා එක කෙල්ලක මේයට (මෙහෙවර සඳහා) පාවා දී ලා (ලබාදී) සත් මාල් (සත් මහල්) මාලිගාවේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක රූපත් ව උපන්නාට පාටොපයට (උඩඟුකමට) සිර ගෙයක ලූවා සේ ලූහ. එක් කුල දරුවකු සොර කමක දී අල්වා ගෙන පිටි තල හයා බැඳ ගෙන (අත්දෙක පිටුපසට කොට තද කොට බැඳීම) සැමිටිවලින් මර - මරා (කසවලින් ගසමින්) මිනී මරණ තැනට ගෙන යෙති. ඒ සිටු දුවණියෝ ද මහත් වූ කෝලාහල නිසා මේ කිම් දෝ හෝ යි මතු මාලේ (ඉහළ මහලේ) සිට බලන්නෝ මරණට ගෙන යන තැනැත්තවූ දැක ඔහු කෙරෙහි පිළිබඳ සිත් (බැඳුණු සිත්) ඇතිව ඌ ම පතා (ඔහු ම ප්‍රාර්ථනා කොට) බතු ත් නො කා යානට නැගීලා වැද හොත්තෝ ය.(නිදාගත්තේය)

මුසුප්පපුව (ශෝකයෙන්) වැදහොත් නියාව (නිදාගත් බව) මෑණියෝ දැක කුමක්දැ'යි විචාරා මරන්ට ගෙන යන තැනැත්තවුන් දැක උන් කෙරෙහි ඇලුම් ඇති නියාව ත් (ඇලීමක් ඇති වූ බවත්) උන් ලදොත් මුත් (ලැබුනොත් මිස) නො ලදොත් (නොලැබුණොත්) ජීවත් වීම නැති නියාව ත් (ජීවත් නොවන බවත්) කී කල්හි 'පුතණ්ඩ, එ සේ සිතන්නේ හැයි ද? මුඹ වර්ධන ව සිටියවුන් (වැඩී ඉන්නවුන්) හෙයින් ගෙයි තබා ගෙන හිඳුමෝ ද? ජාති ආදීන් සරි (කුලය ආදියෙන් ගැළපෙන) සමාන තැනකට පාවා දිය හැක්කැ'යි (පවරා දිය හැකිය) කිවු ය. අපට 'අනික් කවුරුනු ත් නො කැමැත්තේ ය. මුන් නො ලදො ත් මියම්' කිවු ය. මෑණියෝ නො එක් ලෙස කියා ත් ගිවිස්වා (එකඟ කර/පොරොන්දු කර) ගත නො හී (නොහැකිව) පියාණන්ට කිවු ය. උයි ත් (ඔහුත්) කියා ගිවිස්වා ගත නො හී කළමනා (කළයුත්තේ) කිම් දෝ හෝ යි (කුමක්දැයි) සිතා ඒ සොරු මරන්ට ගෙන යන තැනැත්තවුන්ට මසු දහසක් (කහවණු දහසක්) සොරා යවා (හොරෙන් යවා) 'තෙලේ හැර ගෙන තුලු (මෙය අරගෙන ඔහු (සොරා)) නො මරා අපට එවනු මැනව'යි කියා යවූ ය. එයි ත් ගිවිස ඌ සිටාණන්ට හැර ලා අනිකකු මරා පියා 'සොරු මරා පීම්හ'යි රජ්ජුරුවන්ට කිවු ය. සිටාණෝ ත් තමන්ගේ දුවණියන් අර්ථිව (ආශා ඇතිව) ඌ ම කැමති හෙයින් මරණින් ගැළවුණු තැනැත්තවුන්ට සරණ පාවා (විවාහ කොට) දුන්හ.

සිටු දුවණියෝ ත් එවක් පටන් ඔහු සිත් ගන්ට සව්බරණ ලා (සියලු ආභරණ හැඳ) සැරහී ගෙන තුමූ (ඇය) ම ඕ හට බත් මාළු පිසති. කවති. පොවති. ඉස සෝධවති. නාවති. සොරාණෝ ද කීප දවසෙකින් කළ උපකාරත් නො සළකා 'මෑ මරාපියා මෑගේ ආභරණ හැර ගෙන රා බී ඇවිදිනවුන්ට විකොටපියා (විකුණා දමා) අභිප්‍රාය දෙයක් (කැමති දෙයක්) හැර ගෙන කා පියන්නේ කවර දවසෙක දෝ හෝ යි සිතී ය. සිතා ලා එක් උපදෙසක් (උපායක්) සලකාලා බත් නොකා හැඳට නැඟී ලා වැද හොත්තේ ය. සිටු දුවණියෝ ගොසින් ලෙඩක් නිසාදැ යි විචාරා නැතැ යි කී කල්හි අපගේ දෙමවුපියන්ගෙන් මුසුප්පුවක් (සිත්තැවුලක්) ඇති නියා දැ' යි විචාරා 'එයිත් නැතැ'යි කී කල්හි 'එ සේ කල මුසුප්පු හැයි දැ' යි කිවු ය.

'සොඳුර, එ දවස් මරන්ට ගෙන යන ගමනේ සොරුන් හෙලන ගල වසන දෙවියන්ට යාදිනියක් (කන්නලව්වක්/යාඥාවක්) කොට දිවි ලදිමි. දිවි තබා උන්ගේ ම ආනුභාවයෙන් මාගෙන් කිසි ත් වියදමක් නැතිව තොප ත් ලදිමි. උන්ට පිදේනියක් දෙන්ට නැති හෙයින් මුසුප්පුයෙමි' යි කිවු ය. 'එ විතරෙක් වී නම් මුසුප්සු වන්ට නො කැමැත්තේ ය. පිදේනිය පුදමී. වුවමනා කිම් දැ'යි (උවමනා දේ කුමක් දැයි) විචාරා 'ලද පස් මල් හා සමග පැන් නුමුසු කිරි බත් වුව මැනැවැ'යි කී කල්හි 'යහපතැයි මුළුල්ල ම (සියල්ලම) සපයාලා 'එන්න, යම්හ'යි කිවු ය. 'එ සේ වී නම් මාහැඟි පිළී ත් (වටිනා ඇඳුම්) හැඳ ගෙන මාහැඟි වූ ආභරණ ත් ලා ගෙන (දමාගෙන) කෙළ ගෙන, සී ගෙන (ක්‍රීඩා කරමින් සිනාසෙමින්) යන ගමන හෙයින් තොපගේ නෑයනු ත් රඳවා ලා (නවතා) යම්හ'යි කිවු ය. උයි ත් තර ව (ස්ථිරව) සිත් ගන්ට ම සිතන හෙයින් එ ලෙස ම කළ හ.

ගල් පාවුලට (ගල් පාමුලට) ගිය කලට 'සොඳුර, මෙ තැන් පටන් තොප හා මා හා යත් මුත් සෙස්සන් (සෙසු අය) ගෙන යන්ට බැරි ය. බොහෝ දෙනා ගෙන ගිය කල කසළ ත් කෙරෙති. නවතාලිය ත් (නැවැත්වීමටත්) නො හැක්ක. දෙන්න (දෙදෙනා) පමණෙක් යම්හ. දෙවියන් පුදන්ට ගෙන යන දෙය බැවින් පිදේනිය තොප ම අල්වා ගනුව' යි කිවු ය. උයි ත් එලෙස ම කළහ. සොරුත් උන් කැඳවා ගෙන සොරුන් හෙළන ගල උඩට නැංගේ ය. ඒ ගලට ත් එක් දිසාවෙකින් මිනිස්සු නැඟෙති. එක් දිසාවක් ප්‍රපාතව (බෑවුම්ව) තිබෙන හෙයින් ගල් මුඳුනෙහි සිට ලා (සිටගෙන) එ තැනින් සොරුන් හෙළති. ඌ කඩ කඩ ව (කැබලි කැබලිව) බිම හෙති (බිම වැටෙති). එ හෙයින් ඒ ගලට 'සොර පව්ව ය'යි කියති. සිටු දුවණියෝ ද ගල මුඳුනේ සිට 'බිලියම් (බලිපූජා කර්මය) කරන්නැ'යි කිවූ ය. ඒ බැණ නොනැඟෙන්නේ ය (කථා නොකරන්නේය). 'බැණ නො නැඟෙන්නේ හැයි දැ'යි විචාළ හෙයින් 'මට බිලියමින් කම් නැත (ප්‍රයෝජනයක් නැත). බිලියම් පිට ලා ලා (දාලා) තොප මෙ තැනට ගෙනෙන පිණිස ය' යි කිවු ය. 'ගෙනා යේ හැයි දැ' යි විචාළ කල්හි 'තොප මරා පියා ආභරණ හැර ගෙන පලා යන්ට ය'යි කිවු ය.

ඌ තුමූ බා ගොසින් (බියට පත්ව) 'ස්වාමීනි, මාත් අභරණ ත් මුඹ සන්තක (නුඹට අයිති) වුව. මරන්නේ හැයි ද? ආභරණ ත් හැර ගත (අරගනු) මැනව. මා අතිනු ත් මෙහෙ හැර ගත මැනැවැ'යි කිවු ය. ඒ කෙ සේ කීව ත් නොගිවිස ම මරන්ට ම තත්පර ව ගත. හිඟුනුව මැනව (සිතනු මැනවි) මා මිය යාමෙන් ප්‍රයෝජන නැත. ආභරණ හැර ගෙන මාගෙනු ත් මිඬිකම් (දාසකම්/මෙහෙවර) හැරගත මැනවැ යි කිවු ය. ඒ අසා සොරා 'එ සේ කළ කලට තෙපි ගොසින් දෙමවුපියන්ට කියාල ව. එ සේ කලට අපට විනාසය (වැනසීම) කරත් ම ය' යි කිවු ය. සිටු දුවණියෝ සිතන්නෝ මූගේ කටයුත්තක් ඉතා නපුරු නියා ය. නුවණ නම් ඇති වන්නා පළහාගෙන (පුළුස්සා) කන්ට නො වත් ප්‍රයෝජන නිසා වුව. ආදි (මුලදී) කුමක් සිතා කුමක් කෙළෙම් නමුත් තට ත් කළමනා දෙය (නුඹටත් කළයුතු දෙය) දැන් තරයේ (දැඩිව) කෙරෙමි සිතා ලා 'ස්වාමීනි, එ දවස් මරන්ට ගෙන යන නියා ව දැක දෙමවුපියන්ට කීම්. ඌ මසු දහසක් යවා ලා මැරිය නො දී ගෙන්වා ගෙන මට නිළ කොළෝ ය (නියම කළහ). මම එවක් පටන් (එතැන් සිට) පක්ෂපාත ව (හිතවත්ව) ම විසීමි. දැන් මරතී කියා මුසුප්පු වන්ට පිළිවන්ද? බල එකෙක් නම් මියන ගමනේ (මැරෙන මොහොතේ) මා සිතක් මතක් සේ (සිත්වූ හා අදහස් වූ පරිද්දෙන්) වැඳගත (වඳින්නට) දුන මැනවැ'යි කිවු ය. 'යහපත, සොඳුර, වඳුව'යි කියා කවර තරමෙක (කවර ප්‍රමාණයක) වඳිනා වැදීමක් බව ත් නො දැන අවසර දී ලා (ඉඩදී) ගල් කෙළවර සිටියේ ය.

සිටු දුවණියෝ ත් තුන් විටක් පැදකුණු කොට ලා (ප්‍රදක්ෂිණා කොට) සතර තැනෙක (ස්ථාන හතරක) සිට වැඳලා 'ස්වාමීනි, මේ කෙළවර දැක්ම ය (අවසන් දැකීමය). මෙ වක් පටන් (මෙතැන් සිට) මුඹ වහන්සේ ගේ මා දැක්මකු ත් මාගේ මුඹ වහන්සේ දැක්මකු ත් නැත'යි කියා ලා ඉදිරිය දිශාවේ සිට ත් සිප ගෙන පියා පිටි පස්සේ සිට ත් සිප ගෙන පියා කුමක්දෝ සිතමින් ගල් කෙළවර පමා ව සිටියහු තුමූ පිටිපස් ව ලා (පිටුපසට වී) එක් අතෙකින් බොටුව (බෙල්ල) අල්වා ගෙන එක් අතෙකින් පිටුමුල (තුනටිය) අල්වා ගෙන ඌගේ කායබල (ශරීර ශක්තිය) තරමට තමන්ගේ ඥානකෘති වූ මායා බලය (නුවණේ ස්වරූපය ගත් අනුන් රැවටීමේ ශක්තිය) මහත් හෙයින් ගල් මුදුනෙන් දැමුව. හෙතෙම කඩ කඩ ව ගලින් හී (ගලින් වැටී) මිය තෙමේ ම බිලි වි ය. සොර පව්වේ වසන දේවතාවාණෝ උන් දෙන්නාගේ ම කටයුත්ත දැක 'හැම තැන දී ම පිරිමින් උපදෙස් දනිතී නැත. සමහර තැනක ගෑනු ද උපදෙස් දනිතී' කිවු ය.

සිටුදුවණියෝ ද සොරුගේ අකුසල් නැමැති සතුරා ත් සහාය කොට ගෙන සොරු ගලින් හෙළා ලා තමන්ගේ කුසල් නමැති මිත්‍රයාණන් සහාය කොට ගෙන තුමූ ගැළවී ගෙන සිතන්නාහු 'ඉදින් මම ගෙට ගියෙම් නම් තොපගේ ගෙහිමියෝ කොයි දැ' යි එ සේ ත් දොඩති. ඒ ත් මා මරන්ට ගෙන ගිය යි කීම් නම් එයිත් තොප මරන්ට කාරණ කවරේ දැ'යි නො හදහති (විශ්වාස නොකරති). කවර ලෙසින් වුව ත් ගෙට යෑමෙන් ප්‍රයෝජන නැතැ' යි සිතා ලා ආභරණ පැළඳ ගෙන තනි ව යාමෙහි ආදීනව (අයහපත් ප්‍රතිඵල) සලකා එයි ත් එ තැන ම දමා වල් වැද (කැලයට පිවිස) අනුක්‍රමයෙන් (පිළිවෙළින්) ඒ ඒ තැන ඇවිදිනී පරිව්‍රාජිකාවරුන් වසන පන්සලකට ගොසින් වැඳලා 'ස්වාමීනි, මා මහණ කළ මැනවැ'යි කිවු ය. උයිත් තමන් මහණ වූ ලෙසින් මහණ කළහ. මහණ ව ලා ම ප්‍රව්‍රජ්‍යාව ව නම් පුරන ලද ගුණමූලිකව වන හෙයින් ගුණ විශේෂයක් ලබනු කැමැති ව 'ස්වාමීනි, මුඹ වහන්සේගේ අනුශාසනාවෙහි උතුම් කවරේ දැ' යි විචාරා -

"පරිබ්‍රාජිකාවෙනි, කිසුණු පිරියම් කොට (කසිණ භාවනා කොට) ධ්‍යාන හෝ ඉපදවිය යුතු ය. වාද දහසක් හෝ උගත යුතු ය. අපගේ සමයෙහි (දර්ශනයෙහි) තෙල දෙක (ඔය/මේ දෙක) උතුම් ව තිබේ යි කිවු ය. 'ස්වාමීනි, ධ්‍යාන උපදවන්ට මට නො පිළිවන වාද දහස උගනිමි' යි කිවු ය. ඉක්බිති පරිබ්‍රාජිකාවරු ද වාද දහස උගන්වා ලා 'අප දන්නා වාද ඉගෙන නිමවුව. දැන් තොපි දඹදිව් තලෙහි ඇවිද තොප හා වාද කරන්ට සමර්ථ කෙණකුන් (දක්ෂ කෙනෙක්) බලව'යි උන් අතට දඹ අත්තක් දී ලා 'පරිබ්‍රාජිකාවෙනි, යව'යි අවසර දී කියන්නෝ 'ඉදින් ගිහි කෙණෙක් තොප හා වාද කටහුන වූ නම් (කළ හැකි වී නම්) උන්ට පාදපරිචාරිකා (භාර්යාව) වව. ඉදින් පැවිදි කෙණෙක් වාද කිරීමට සමර්ථ වූ නම් උන් ලඟ මහණ වව' යි උගන්වා යවු ය. උයිත් දඹ අත්ත අතින් ගෙන ඇවිදිනා හෙයින් ජම්බුපරිබ්‍රාජිකා නම් ව එයින් නික්ම දුටු දුටු කෙණකුන් හා (දකින දකින අය සමග) වාද කෙරෙමින් ඇවිදිති. උන් හා වාද කට හෙන කෙණෙක් සම්භ නු වූ ය. ඒ ඒ තැන මිනිස්සු ජම්බුපරිබ්‍රාජිකාවෝ එතී බසක් ඇසූ කල ම උන්ගේ නමට ම දුරු බා (දුරුදීම බිය වී) පලායෙති. ඌ තුමූ ගමකට හෝ නියම්ගමකට (වෙළඳසැල් ඇති මහාගමකට) හෝ සිඟා වදනා කල ගම් දොර එක් තැනෙක වැලි රැසක් කොට ලා (වැලි ගොඩක් ගසා) අත්ත ඊ හිඳුවා ලා මා හා වාද කට හෙන කෙණකුන් දඹ අත්ත මිරිකන බව (මිරිකන්න/පොඩි කරන්න) ය'යි කියාලා ගමට සිඟා වදිති (පිඬු පිණිස යති). වාද තබා දඹ අත්ත මළානික වූ කල (මැලවී ගිය කල්හී) අනික් දඹ අත්තක් හැර ගනිති.

මෙ ලෙස ම කොට ඇවිදිනෝ සැවත් නුවරට ගොසින් නුවර වාසල කෙරේ දඹ අත්ත සිටුවා ලා ආදි ලෙස ම සම්මතයක් කොට ලා සිඟා නුවරට වන්නාහු ය. ගම් දරුවෝ (ගමෙහි වසන දරුවෝ) දඹ අත්ත වට කොට ගෙන සිටියහ. සැරියුත් මහ තෙරුන් වහන්සේ සිඟා වළඳාලා නුවරින් නික්මෙන සේක් දඹ අත්ත පිරිවරා සිටි සුඟුන් (කුඩා දරුවන්) දැක 'මේ කිම් දැ'යි විචාළ සේක. කුඩා සුඟු (කුඩා ළමයි) මහ තෙරුන් වහන්සේට එපවත් කීහ. ඔබ ත් 'එ සේ වී නම් දඹ අත්ත මඬුව'යි (මිරිකන්න/පොඩිකරන්න) වදාරා 'බම්භ'යි (බියහ) කී කල්හි වාද කිරීම අපට භාර ය. තෙපි මඬුව' යි වදාළ සේක. මහතෙරුන් වහන්සේගේ බසින් (වචනයෙන්) තුමූ උපන් උත්සාහ ඇති ව අත්ත මැඬ

හඬ ගසමින් ධූලි (දූවිලි) උඩ නංවා පීහ. පරිව්‍රාජිකාවෝ අවුත් සුඟුන් ම කළ දෙයකැ'යි සිතා බැණ දොඩා 'තොප හා අප කරණ වාද නැත. කුමක් නිසා අපගේ දඹ අත්ත මැඩියා දැ'යි කිවු ය. කුඩා සුගු 'මහ තෙරුන් වහන්සේගේ බසින් අත්ත මැඬුම්හ. අපි කුමට මිරිකමෝ දැ'යි කිවූ ය. ඔබ ත් (උන්වහන්සේත්) එ තැන ම වැඩ සිටි හෙයින් 'ස්වාමීනි, මුඹ වහන්සේ ද මැඬ වූ සේක් ය'යි විචාළෝ ය.

ඔබ ද (උන්වහන්සේ ද) එ බසට වදාරන සේක් 'නැගණියෙනි, අත්ත මැඬ වූවෝ එ සේය, අපි ය' යි වදාළ සේක. 'දඹ අත්ත මැඬ වූවා සේ ම අප හා වාද ත් කළ මැනවැ' යි කිවු ය. යහපත, වාද කරම්හ' යි වදාළ සේක. පරිබ්‍රාජිකාවෝ ප්‍රශ්න විචාරන්ට පස් වරු (සවස් කාලයේ) සැරියුත් මහ තෙරුන් වහන්සේ ලඟට වැඩ හිඳිනා තැනට ගියහ. නුවර මුළුල්ල (සියල්ල) අසුරන් වැද ගිය (අසුරයන් කඩා වැදුණු) දිව්‍ය පුරයක් මෙන් ඇළලී (කැළඹී) දෙපක්‍ෂයේ කථා අසම්හ' යි නුවර වැස්සෝ පරිබ්‍රාජිකාවන් හා කැටි ව ම ගොසින් මහ තෙරුන් වහන්සේ වැඳ ලා එකත්පස් ව (එක්පැත්තකට වී) හුන්හ. පරිබ්‍රාජිකාවෝ මහ තෙරුන් වහන්සේට 'ප්‍රශ්නයක් විචාරමි' යි කිවු ය. 'තබන්නේ කවර දවසට ද? විචාරව' යි වදාළ සේක. ඌ තමන් උගත් වාද දහස ම විචාළෝ ය. මහ තෙරුන් වහන්සේ විසඳා ලූ සේක. විසඳා නිමවා ලා 'තොප විචාරන ප්‍රශ්න මෙ තෙක් ද? තවත් ඇත් ම දැ' යි විචාළ සේක. උගත් වාද එ තෙක් ම හෙයිනුත් ඒ ම පිරිමසා (පිරිමහගෙන) ඇවිදි පමණක් මුත් ඔබ්බෙන් (වෙනත්) උගත් දෙයක් නැති හෙයිනු ත් පුරාතනයන් සිතා උපදවාලුවා (උපදවාගත් දෙය) තමන් සිත ගෙන කියා ලන්ට බල නැති හෙයිනු ත් (ශක්තිය නැති නිසා) එතෙකැ'යි කිවු ය.

'තොපි අප අතින් බොහෝ ප්‍රශ්න විචාළා වේ ද? අපි ත් ඒ විසඳා කීමෝ වේ ද, තොප අතින් අපි බොහෝ කොට නොවිචාරම්හ. එක සුඟක් විචාරම්හ. ඒ කියවූ දැ'යි විචාළ සේක. 'විචාළ මැනව, ස්වාමීනි' යි කිවු ය. 'එකක් විචාරම්හ' යි කී හෙයින් එ ම අල්වා ගෙන 'එකෙක් නම් කිම් දැ' යි විචාළ සේක. ඌ තමන් පිටත් ශාස්ත්‍ර උගත් බව මුත් (බුදුදහමෙන් පිට වෙනත් ශාස්ත්‍රයන් උගත් නමුත්) ශාසන සමය (බුද්ධ ධර්මය) නො දන්නා විචාළ ලෙසට විසඳන ලෙස නො දැන 'ඒ කිම් දැ'යි විචාළෝ ය. 'හෙම්බා පරිබ්‍රාජිකාවෙනි, තෙලේ (එය) බුදුන්ගේ පැනයෙකැ'යි කී සේක. තමන් ශාස්ත්‍රලොභී (ශිල්පයට ආශා ඇති) හෙයින් 'මා ත් ස්වාමීනි, ඒ උගන්වා වදාළ මැනැව'යි කිවු ය. "බුදුහු පවා දායාද ඉල් වූ රහල් කුමරුන්ට 'අප සේ ව ගෙන (අප මෙන් වී ගෙන/මහණවී) හැර ගනුව'යි වදාළ සේක. තෙපි ත් අප සේ වූ නම් දෙවම්හ" යි වදාළ සේක. 'එ සේ වී නම් මා මහණ කළ මැනව'යි කිවු ය. මහ තෙරුන් වහන්සේ ත් මෙහෙණින්නන්ට (භික්ෂුණීන්ට) කියා ලා මහණ කැරවූ සේක. උයි ත් මහණ ව මාලු පැවදි ව (පැවිදි ව උපසම්පදා වී) කුණ්ඩලකෙසී නම් ස්ථවිරී ව කීප දවසකින් සිවුපිළිසිඹියා පත් (අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන යන කරුණු සතරට පැමිණ) රහත් ව එවක මරණ දුකින් ගැළවුණාසේ ම සසර දුකිනු ත් ගැළවූහ.

ධම් සෙබෙහි ත් (ධර්ම සභාවෙහි) රැස් ව හුන් වහන්දෑ ද කුණ්ඩලකේසීන් ඇසූ බණකු ත් බොහෝ නො වෙයි. එතකුදු වුව ත් රහත් වූ ය. එක් සොරකු හා ත් යුද්ධ කොට උයි ත් පරදවා අවු ය' යි ස්වර්ගමොක්ෂ බාධක (දිව්‍යලෝකයට හෝ නිර්වාණයට බාධක වූ) කථාවක් නො වන හෙයිනු ත් රැස් වූ තැන් විසින් තුෂ්ණිම්භූත වීම (නිශ්ශබ්දවීම) හෝ ධර්මදානෝපේත (දැහැමි දානාදි කථාවෙන් යුක්තවූ) කථාවෙන් යුක්ත ව ඉඳීම හෝ යුක්ත බැවින් මේ කථා කෙරෙමින් හුන් සේක. බුදුහු වැඩ විචාරා වදාරා මේ නියාව දැන 'මා දෙසූ බණ මඳෙකැ' යි කියා ත් බොහෝවකැ' යි කියා ත් නො කියව. යමෙක් තෙමේ ස්ත්‍රීවර්ණනා ආදී වූ අනර්ථාවහ (ප්‍රයෝජනයක් ගෙන දෙන්නාවූ) නො වන දෙයින් යුක්ත වූ සිය ගණන් කථා ත් තමා දොඩන්ට සුරු හෙයින් (කියනන්ට දක්ෂ හෙයින්) කියා නමු ත් කිසි කෙණෙකුන්ට කිසිත් ප්‍රයෝජනයෙක් පරලොවින් නැත. යම් කථාවක් අසා සත්ත්වයෝ නිවන් දකිත් නම් ඒ ම යහපත.

'යම් කෙණෙක් තුමූ දස දහසක් පමණ වු ත් සතුරු සෙනඟ හා සටනට ගොසින් සටන් බිම දී තමන් යොධ හෙයින් අරුන් හැම පරදවා තුමූ ම ජය ලැබෙත් ද, සිතන්නවුන්ට යහපත සේ සිතන බව මුත් ඒ සටන උතුම් නො වෙයි. යම් කෙණකුන් රූ වසන තැන ත් දාවල් වසන තැන ත් කමටහන් මෙනෙහි කිරීමෙන් දහස් ගණනට ත් වඩා සිටිනා රා දොස් ආදි වූ කෙලෙස් සතුරන් පරදවා නිවන් රට ලැබ සිටි ත් නම් සටන ජය ගත්තවුන් මුළුල්ලට ම ඌ උතුම්හ යි වදාළ සේක. දේසනා කෙළවර බොහෝ දෙන සෝවාන් " සෙදගැමි " අනගැමි " රාත් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ලැදි සටන් ආදී වූ සෙසු සටන් හැර විවසුන් නමැති අතින්, මාර්ගඥාන නමැති කඩු ගෙන කෙලෙස් සතුරන් හා සටනට ම නියැළී හින්ද යුතු.

- මෙම ගාථා වනපොත් කරන්න -

යො වෙ ගාථා සතං භාසෙ - අනත්ථ පද සංහිතා
එකං ගාථා පදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති

යො සහස්සං සහස්සෙන - සංගාමෙ මානුසෙ ජිනෙ
එකං ච ජෙය්‍ය අත්තානං - සවෙ සංගාමා ජුත්තමො

න සො සබ්බෙසු ඨානෙසු - පුරිසො හොති පණ්ඩිතො
ඉත්ථීපි පණ්ඩිතා හොති - තත්ථ තත්ථ විචක්ඛණෙ

* **පහත සඳහන් ගද්‍ය පාඨයන්හි අවස්ථා සම්බන්ධය ලියා දක්වන්න.**

''පුතණ්ඩ, එ සේ සිතන්නේ හැයි ද? මුඹ වර්ධන ව සිටියවුන් (වැඩී ඉන්නවුන්) හෙයින් ගෙයි තබා ගෙන හිඳුමෝ ද? ජාති ආදීන් සරි (කුලය ආදියෙන් ගැළපෙන) සමාන තැනකට පාවා දිය හැක්කැ''

....

....

....

....

''තෙලේ හැර ගෙන තුලු (මෙය අරගෙන ඔහු (සොරා)) නො මරා අපට එවනු මැනව''

....

....

....

....

''අපගේ දෙමවුපියන්ගෙන් මුසුප්පුවක් (සිත්තැවුලක්) ඇති නියා දැ''

....

....

....

....

''සොඳුර, එ දවස් මරන්ට ගෙන යන ගමනේ සොරුන් හෙලන ගල වසන දෙවියන්ට යාදිනියක් කොට දිවි ලදිමි. දිවි තබා උන්ගේ ම ආනුභාවයෙන් මාගෙන් කිසි ත් වියදමක් නැතිව තොප ත් ලදිමි. උන්ට පිදේනියක් දෙන්ට නැති හෙයින් මුසුප්පුයෙමි''

....

....

....

....

''එ විතරෙක් වී නම් මුසුප්සු වන්ට නො කැමැත්තේ ය. පිදේනිය පුදමි. වුවමනා කිම් දැ''

....

....

....

''ලද පස් මල් හා සමග පැන් නුමුසු කිරි බත් වුව මැනැවැ''

....

....

....

....

''එ සේ වී නම් මාහැඟි පිළී ත් (වටිනා ඇඳුම්) හැඳ ගෙන මාහැඟි වූ ආභරණ ත් ලා ගෙන (දමාගෙන) කෙළ ගෙන, සී ගෙන (ක්‍රීඩා කරමින් සිනාසෙමින්) යන ගමන හෙයින් තොපගේ නෑයනු ත් රඳවා ලා (නවතා) යම්හ''

''සොඳුර, මෙ තැන් පටන් තොප හා මා හා යත් මුත් සෙස්සන් ගෙන යන්ට බැරි ය. බොහෝ දෙනා ගෙන ගිය කල කසළ ත් කෙරෙති. නවතාලිය ත් නො හැක්ක. දෙන්න පමණෙක් යම්හ. දෙවියන් පුදන්ට ගෙන යන දෙය බැවින් පිදේනිය තොප ම අල්වා ගනුව''

''මට බිලියමින් කම් නැත . බිලියම් පිට ලා ලා තොප මෙ තැනට ගෙනෙන පිණිස ය''

''තොප මරා පියා ආභරණ හැර ගෙන පලා යන්ට ය''

''ස්වාමීනි, මාත් අභරණ ත් මුඹ සන්තක වුව. මරන්නේ හැයි ද? ආභරණ ත් හැර ගත මැනව. මා අතිනු ත් මෙහෙ හැර ගත මැනැවැ''

''එ සේ කළ කලට තෙපි ගොසින් දෙමවුපියන්ට කියාල ව. එ සේ කලට අපට විනාසය කරත් ම ය''

''ස්වාමීනි, එ දවස් මරන්ට ගෙන යන නියා ව දැක දෙමවුපියන්ට කීමි. උඉ මසු දහසක් යවා ලා මැරිය නො දී ගෙන්වා ගෙන මට නිළ කොළෝ ය. මම එවක් පටන් පක්‍ෂපාත ව ම විසීමි. දැන් මරතී කියා මුසුප්පු වන්ට පිළිවන්ද? බල එකෙක් නම් මියන ගමනේ මා සිතක් මතක් සේ වැඳගත දුන මැනවැ''

''ස්වාමීනි, මේ කෙළවර දැක්ම ය . මෙ වක් පටන් මුඹ වහන්සේ ගේ මා දැක්මකු ත් මාගේ මුඹ වහන්සේ දැක්මකු ත් නැත''

''හැම තැන දී ම පිරිමින් උපදෙස් දනිතී නැත. සමහර තැනක ගෑනු ද උපදෙස් දනිතී''

"පරිබ්‍රාජිකාවෙනි, කිසුණු පිරියම් කොට ධ්‍යාන හෝ ඉපදවිය යුතු ය. වාද දහසක් හෝ උගත යුතු ය. අපගේ සමයෙහි තෙල දෙක උතුම් ව තිබේ''

''ඉදින් ගිහි කෙණෙක් තොප හා වාද කටහුන වූ නම් උන්ට පාදපරිචාරිකා වව. ඉදින් පැවිදි කෙණෙක් වාද කිරීමට සමර්ථ වූ නම් උන් ලඟ මහණ වව''

''එ සේ වී නම් දඹ අත්ත මඬුව''

''තොප හා අප කරණ වාද නැත. කුමක් නිසා අපගේ දඹ අත්ත මැඬියා දැ''

''මහ තෙරුන් වහන්සේගේ බසින් අත්ත මැඬුම්හ. අපි කුමට මිරිකමෝ දැ''

''ස්වාමීනි, මුඹ වහන්සේ ද මැඩ වූ සේක් ය''

''නැගණියෙනි, අත්ත මැඩ වූවෝ එ සේය, අපි ය''

''දඹ අත්ත මැඩ වූවා සේ ම අප හා වාද ත් කළ මැනවැ''

''තොපි අප අතින් බොහෝ ප්‍රශ්න විචාළා වේ ද? අපි ත් ඒ විසඳා කීමෝ වේ ද, තොප අතින් අපි බොහෝ කොට නොවිචාරම්හ. එක සුඟක් විචාරම්හ. ඒ කියවූ දැ''

''මා දෙසූ බණ මඳෙකැ' යි කියා ත් බොහෝවකැ' යි කියා ත් නො කියව. යමෙක් තෙමේ ස්ත්‍රීවර්ණනා ආදී වූ අනර්ථාවහ නො වන දෙයින් යුක්ත වූ සිය ගණන් කථා ත් තමා දොඩන්ට සුරු හෙයින් කියා නමු ත් කිසි කෙණෙකුන්ට කිසිත් ප්‍රයෝජනයෙක් පරලොවින් නැත. යම් කථාවක් අසා සත්ත්වයෝ නිවන් දකිත් නම් ඒ ම යහපත.''

*** පහත සඳහන් ගද්‍යපාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

''සොඳුර, එ දවස් මරන්ට ගෙන යන ගමනේ සොරුන් හෙලන ගල වසන දෙවියන්ට යාදිනියක් කොට දිවි ලදිමි. දිවි තබා උන්ගේ ම ආනුභාවයෙන් මාගෙන් කිසි ත් වියදමක් නැතිව තොප ත් ලදිමි. උන්ට පිදේනියක් දෙන්ට නැති හෙයින් මුසුප්පුයෙමි''

*** මෙම ප්‍රකාශය සිදු කරන්නේ කවුරුන් විසින් කාහට ද?**

....

*** මේ ප්‍රකාශය සිදු කරන්නේ (ප්‍රකාශක විසින්) කුමක් සිතෙහි තබා ගෙන ද?**

....

....

''සොඳුර, මෙ තැන් පටන් තොප හා මා හා යත් මුත් සෙස්සන් ගෙන යන්ට බැරි ය. බොහෝ දෙනා ගෙන ගිය කල කසළ ත් කෙරෙති. නවතාලිය ත් නො හැක්ක. දෙන්න පමණෙක් යම්හ. දෙවියන් පුදන්ට ගෙන යන දෙය බැවින් පිදේනිය තොප ම අල්වා ගනුව''

*** මෙම ප්‍රකාශය සිදු කරන්නේ කවුරුන් විසින් ද?**

....

*** මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියා දක්වන්න.**

....

....

''හැම තැන දී ම පිරිමින් උපදෙස් දනිතී නැත. සමහර තැනක ගෑනු ද උපදෙස් දනිතී''

*** මෙම ප්‍රකාශය සිදු කරන්නේ කවුරුන් විසින් ද?**

....

*** මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියා දක්වන්න.**

....

....

....

''ඉදින් ගිහි කෙණෙක් තොප හා වාද කටහුන වූ නම් උන්ට **පාදපරිචාරිකා** වව. ඉදින් පැවිදි කෙණෙක් වාද කිරීමට සමර්ථ වූ නම් උන් ලඟ මහණ වව''

*** මෙම උපදේශය ලබා දුන්නේ කවුරුන් වෙත ද?**

....

*** තද කළු අකුරින් දක්වා ඇති පදයන්හි අර්ථ ලියන්න.**

....

''මා දෙසූ බණ මදෙකැ' යි කියා ත් බොහෝවකැ' යි කියා ත් නො කියව. යමෙක් තෙමේ ස්ත්‍රීවර්ණනා ආදී වූ අනර්ථාවහ නො වන දෙයින් යුක්ත වූ සිය ගණන් කථා ත් තමා දොඩන්ට සුරු හෙයින් කියා නමු ත් කිසි කෙණෙකුන්ට කිසිත් ප්‍රයෝජනයෙක් පරලොවින් නැත. යම් කථාවක් අසා සත්ත්වයෝ නිවන් දකිත් නම් ඒ ම යහපත.''

*** මෙහි සඳහන් ධර්මෝපදේශය උපුටා දක්වන්න.**

....

....

* කුණ්ඩලකේසීගේ වස්තුව තුළ අන්තර්ගත උපමාවන් තෝරා ලියන්න.

* කුණ්ඩලකේසීගේ වස්තුව තුළ සඳහන් ධර්මෝපදේශ තෝරා ලියන්න.